**හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

--------------------------------

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 26 වන දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 22 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 24 දිනද ,සභාපතිවරයාට යවා ඇත.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

(අ) <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමි ශේෂය රු.7,217,137 ක් වුවද එය රු.9,969,704 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.119,790,105 ක් වටිනා ගිණුම් විෂයයන් 05 කට අදාල හිමිකම් තහවුරු කිරීමේ ලේඛන, තක්සේරු වාර්තා හා විස්තරාත්මක උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | මෙම වර්ෂය තුල ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

**1.4** <u>අනුකූල නොවීම්</u>

<u>නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්</u>

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | <u>1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත</u> | | | |
| | 149 වගන්තිය | සභා සීමාව තුල පිහිටි හෝටල් 03 කින් 2018 වර්ෂයේ සිට සියයට 1 දක්වා බදු මුදල් අය කර නොමැති අතර, 2018 වර්ෂයට අදාලව එක් හෝටලයකින් රු.417,910 ක හිඟ බදු මුදලක් අයවිය යුතුව තිබුණි. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | 2018 වර්ෂය වෙනුවෙන් හිඟ මුදල් ඉදිරියේදි අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | <u>1988 ප්‍රාදේශිය සභා (මුල්‍ය හා පරිපාලන)රිති සංග්‍රහය</u> | | | |
| | රීති 114 | සභාව විසින් අවස්ථා 15 කදී දෙන ලද රු.700,140 ක අත්තිකාරම් අය කරගෙන නොතිබුණි. | රීති අනුව කටයුතු කළ යුතුවේ. | අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.6 වගන්ති | සේවය හැරගිය නිලධාරියකුගෙන් අයවිය යුතු රු.26,920 ක ණය මුදලක් අය කරගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ අය කරගත යුතුවේ. | අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ඈ) | <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි</u> | | | |
| | මු.රෙ 571 | තැන්පත් කර වසර 02 කට වැඩි කාලයක් ඉක්මවු රු.296,414 ක තැන්පතු 02 ක් නියාදනය කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදි සභා අරමුදලට බැර කිරීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය | සභාවට අයත් දේපල වසර 05 කට වරක් තක්සේරු කරගත යුතු වුවද, කඩ කාමර 24 ක් එලෙස තක්සේරු නොකර 2013 වර්ෂයේ තක්සේරුව පදනම් කර ගනිමින් කුලී අය කරමින් පැවතුනි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදි තක්සේරු කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,454,292 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,052,835 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්,බිල්කළ ආදායම් ,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් තොරතුරු පහත දැක්වේ.

| | | **2019** | | | | **2018** | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,999,147 | 2,063,228 | 2,105,991 | 893,155 | 2,421,076 | 2,108,608 | 2,003,313 | 417,763 |
| (ii) | කුලී | 2,655,116 | 869,800 | 1,506,855 | 1,148,261 | 1,738,200 | 804,560 | 2,275,543 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 666,200 | - | 682,810 | - | 560,100 | - | 693,030 | - |
| (iv) | වෙනත් ආදායම් | 45,823,268 | 41,861,452 | 41,861,452 | 3,961,816 | 4,241,440 | 42,082,908 | 42,082,908 | 328,531 |
| | එකතුව | 52,143,731 | 44,794,480 | 46,157,108 | 6,003,232 | 8,960,816 | 44,996,076 | 47,054,794 | 746,294 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර කට අධික කාලයක සිට පැවත එන02 ලැබිය යුතු ආදායම් ණය ගැතියෝ රු . 26,438,600ක් අය කරගෙන නොතිබුණි. | ලැබිය යුතු ආදායම් අය කරගත යුතුවේ. | අය නොවන ආදායම් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |

**2.2.3** උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------------------------ | -------------------- | ------------------------- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු උසාවි දඩ රු.5,305,297 ක් සහ හිඟ මුද්දර ගාස්තු රු.8,611,484 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩ හා හිඟ මුද්දර ගාස්තු අය කරගත යුතුවේ. | හිඟ උසාවි දඩ මුදලින් රු.878,030 ක් සහ හිඟ මුද්දර ගාස්තු වලින් රු.500,000 ක් අය කරගෙන ඇත. |

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය,පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------------------- | ------------------------------ | -------------------------- |
| සභාව එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාළ කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | ප්‍රදේශයට ගැලපෙන පරිදි ඉලක්ක හා දර්ශක හඳුනා හඳුනාගෙන ඉදිරියේදී කටයුතු කරමි. |

**3.2** කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------------------------- | -------------------- | ----------------------- |
| වසර 02 කට අධික කාලයක සිට පැවත එන ගෙවිය යුතු වියදම් ණය හිමියෝ රු.2,412,614 ක් හා කර්මාන්ත ණය හිමියෝ රු.9,969,704 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුවේ. | නිරවුල් කිරීමට කටයුතු කරමි. |

**3.3** **<u>මානව සම්පත් කළමනාකරණය</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක අතිරික්ත 02 ක් සහ තනතුරු 05 කට අදාලව පුරප්පාඩු 08 ක් පැවතුනි. | අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් කරගැනීම හා පුරප්පාඩු පුරවා ගත යුතුවේ. | පළාත් පාලන කොමසාරිස් වෙතින් ඉල්ලීම් කර ඇත. |

**4.** **<u>ශිණුම් කටයුතු භාවය හා යහපාලනය</u>**

**4.1** **<u>විගණන හා කළමනාකරණ කමිටු</u>.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 01ක් පමණක් පවත්වා තිබුණි. | කාර්තුවකට එක් වරක් වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | ඉදිරියේදි නියමිත පරිදි පැවැත්වීමට කටයුතු කරමි. |